පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 07

# දෙවන වාර පරීක්ෂණය - 2019

විෂයය **පෙරදිග සංගීතය I,II**

පාසලේ නම : ..................................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ....................................................
....................................................

කාලය : පැය **02** යි.

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. සප්තකයේ ස්වරවලට උච්ච ස (ස්‍) ස්වරය එකතු වූ විට,

i. මධ්‍ය සප්තකය යි
ii. මන්ද්‍ර සප්තකය යි
iii. ස්වර අෂ්ඨකය යි
iv. උච්ඡ සප්තකය යි

02. සප්තකයේ අචල ස්වර යනු,

i. ස, ම ස්වර වේ
ii. රි, ධ ස්වර වේ
iii. ස, ග ස්වර වේ
iv. ස, ප ස්වර වේ

03. හාර්මෝනියම් යනුවෙන් හඳුන්වන්නේ,

i. මවුත් ඕගනය යි
ii. එකෝඩියනය යි
iii. සර්පිනාව යි
iv. මෙලෝඩිකාව යි

04. | ස ස ග - | රි රි ම - | ග ග ප - | ම ධ ප - | යනුවෙන් ආරම්භ වන්නේ,

i. ඇත ඇදී යළි මැතට පාවේ
ii. කඳු කඳු නැගෙනා
iii. බැතිනා සිරිපා කරුණා කරනා
iv. කඳුපෙළ අතරේ

05. Doe a deer a Female deer යන ගීතය,

i. සරල ගීතයකි
ii. ළමා ගීතයකි
iii. ස්වර ස්ථාපන ගීතයකි
iv. චිත්‍රපට ගීතයකි

06. ''වඳිමු සුගත ශාක්‍ය සිංහ'' යන ගී පාදය

i. මාත්‍රා 2න් 2ට බෙදේ
ii. මාත්‍රා 3න් 3ට බෙදේ
iii. මාත්‍රා 4න් 4ට බෙදේ
iv. මාත්‍රා 3 හා 4 වශයෙන් බෙදේ

07. සුෂිර වාද්‍ය භාණ්ඩ යුගලයක් නොවන්නේ,

i. සර්පිනාව, එකෝඩියනය
ii. මෙලෝඩිකාව, බටනලාව
iii. සිතාරය, ගිටාරය
iv. හොරණෑව, සර්පිනාව

08. අඬුව (Bow) ආධාරයෙන් වාදනය කරන සංගීත භාණ්ඩයක් වන්නේ,

i. වයලීනය
ii. ගිටාරය
iii. සිතාරය
iv. මවුත් ඕගනය

09. තාලම්පටින් නිකුත්වන ධ්වනි දෙකෙහි සංකේත වන්නේ,

i. × 0
ii. 2, 3
iii. ∧ , /
iv. ×, 2

Education NCP - www.edncp.lk

10. එකැස් බෙරය යනු,

i. රබාන යි ii. බුම්මැඩිය යි iii. තාලම්පට යි iv. ගැටබෙරය යි

- **අංක 11 සිට 15 දක්වා නිවැරදි පිළිතුර යා කරන්න.**

| | |
|---|---|
| 11. මුරලි හා බන්සුරි | කෝළම් ගීතයකි. |
| 12. අම්මා මාව දොයි කරන්න | අපරදිග ස්වර නාමයකි. |
| 13. On The Beat (ඔන් ද බීට්) | බටනලා වර්ග 2කි. |
| 14. ගම්වල සැම තැන | ළමා ගීතයකි. |
| 15. Re (රේ) | සමගුහය. |

- **අංක 16 සිට 20 දක්වා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.**

**( ඕගනය, තබ්ලාව, තානායම්පොළ, සමගුහ, හින්දුස්ථානී)**

16. …………………………………………….. විද්‍යුත් ස්වර පුවරු භාණ්ඩයකි.

17. කෝළම් නාට්‍ය රඟ දක්වනු ලබන ස්ථානය …………………………………………….. නමින් හඳුන්වයි

18. ''පෙරදිග මුතු ඇටයයි මේ'' යන ගීතය ආරම්භ වන්නේ ……………………………………………..යෙනි,

19. හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය …………………………………………….. වේ.

20. නූර්ති ගීත සඳහා …………………………………………….. සංගීතයේ ආභාසය ලැබී ඇත.

(ල 2 x 20 = 40)

Education NCP - www.edncp.lk

# II පත්‍රය

- **තෝරාගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත දක්වා ඇති ස්වර ප්‍රභේද හඳුන්වන්නේ කුමන නමකින්ද? ප්‍රශ්න අංකය සමඟ පිළිතුර ඔබේ පිළිතුරු පත්‍රයේම ලියා දක්වන්න. (ල 08)

i. ස රි ග ම ප ධ නි

ii. රි ග ම් ධ නි


iii. රි ග ධ නි

iv. ම්

v. ස්වර 12 පිළිවෙලින් (ල 04)

02. පහත දැක්වෙන්නේ ස්වර අභ්‍යාසයක ආරෝහණ රටාවේ කොටසකි. එහි හිස් කොටුවලට අදාළ ස්වර ලියන්න.

i. ඔබේ පිළිතුරු පත්‍රයේ පහත සටහන පිටපත් කරගෙන එහි හිස්කොටුවල අදාළ ස්වර ලියා සම්පූර්ණ කරන්න. (ල 04)




ii. ඔබ කැමති වෙනත් ස්වර අභ්‍යාසයක් උච්ච සප්තකය දක්වා ගොඩනගන්න (ල 04)

iii. ඔබ කැමති ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල 04)

03.

i. පහත රිද්ම රටාවන්ට අදාළ දේශීය තිත් රූප නම් කරන්න. (ල 06)

a) | x x | x x | x x | x x |

b) | x x x | x x x | x x x | x x x |

c) | x x x x | x x x x | x x x x | x x x x |

ii. මාත්‍රා 3 බැගින් විභාග වන දේශිය තිතට අදාළ බෙර පදයක් නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල 03)

iii. ඔබ උගත් හින්දුස්ථානි තාල පදයක් තාල සංඥා සහිතව ප්‍රස්ථාර කර දක්වන්න (ල 03)

04.

i. පහත සඳහන් ගීත කුමන ග්‍රහයට අයත්දැයි වෙන් කර ලියන්න.

a) දුර පෙනෙන තැනිතලා

b) සසර වසන තුරු

c) හෙළ ජාතික අභිමානේ

d) ගලන ගඟකි ජීවිතේ

e) අම්මා සඳකි

f) ලංකා ලංකා

g) මට මැණි වගේ

h) සාධු දන්ත දා

| සම ග්‍රහ | අව ග්‍රහ | විෂම ග්‍රහ |
|---|---|---|
| | | |

(ල 08)

ii. යහපත් පුරවැසියෙකු බිහිකිරීම සඳහා උපදේශාත්මක ගීත ඉතා වැදගත්වේ. එවැනි උපදේශයක් ලබා දෙන ඔබ දන්නා උපදේශාත්මක ගීතයක් ලියා දක්වන්න. (ල 04)

Education NCP - www.edncp.lk

05.

i. දරු නැළවිලි ගීත පිළිබඳව ඔබ දන්නා කරුණු තුනක් ලියන්න. (ල 06)

ii. ඔබ උගත් දරු නැළවිලි ගීතයක් ලියා දක්වන්න. (ල 06)

06.

i. අඹ දඹ නාරං, දන්න වංහුං අප කන්නසාමි යන ගීත ඇතුළත් නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳ කරුණු හතරක් ලියන්න. (ල 08)

ii. කෝලම් නාට්‍යවලදී භාවිතා කරනු ලබන ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය කුමක්ද?. (ල 01)

iii. ඔබ උගත් කෝලම් නාට්‍ය ගීතයක් ලියන්න. (ල 03)

07.

i. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන ඒ පිළිබඳව කරුණු දෙක බැගින් වෙන් වෙන් වශයෙන් ලියන්න.

a) ලය
b) දේශාභිමානී ගීත
c) කෝමළ ස්වර
d) ත්‍රිවිධ සප්තකය (ල 06)

ii. පහත සඳහන් මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන පද පේළි අටකට නොඅඩු ගී පද මාලාවක් නිර්මාණය කරන්න. (ල 06)

a) අපේ ගුරුතුමී
b) හිමිදිරි උදෑසන
c) අහස
d) කෝච්චිය

Education NCP - www.edncp.lk

PAST PAPERS WIKI



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440